# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVII JULY 2023 Issue No. 08


## ශුද්ධවූ බයිබලය

**(යෙසායා 49:1-6)**

01. ද්වීපයෙනි, මාගේ බස් අසන්න; දුර සිටින සෙනඟෙනි, ඇහුම්කන්දෙන්න. ස්වාමීන්වහන්සේ කුසේ පටන් මා කැඳවා, මාගේ මවු ගර්භයේ පටන් මාගේ නම සඳහන් කළසේක.

02. උන්වහන්සේ මාගේ මුඛය තියුණු කඩුවක් මෙන් කොට, තමන්ගේ අත් සෙවණෙහි මා සැඟෙවුසේක; උන්වහන්සේ මා මුවහත්කර තිබෙන ඊගසක් මෙන් කොට, තමන්ගේ කොපුවේ වසා තබා:

03. ඉශ්‍රායෙල්, නුඹ මාගේ මෙහෙකරුවාය; නුඹ කරණකොටගෙන ගෞරව ලබාගන්නෙමියි මට කීසේක.

04. නුමුත් මම කථාකොට: මම පලක් නැතුව වෙහෙසුණෙමි, හිස්කමටත් නිෂ්ඵලකමටත් මාගේ ශක්තිය නැති කරගතිමි. එසේ වී නුමුත් සැබවින්ම මාගේ විනිශ්චය ස්වාමීන්වහන්සේ වෙතද මාගේ විපාකය මාගේ දෙවියන්වහන්සේ වෙතද තිබේයයි කීමි.

05. ඉතින් තමන් වෙතට යාකොබ් හැරවීමටත් ඉශ්‍රායෙල්වරුන් තමන් වෙතට රැස්කිරීමටත් කුසේ පටන් මා තමන්ට සේවකයෙක් කරගත්තාවූ ස්වාමීන්වහන්සේ මෙසේ වදාරනසේක: (මක්නිසාද ස්වාමීන්වහන්සේගේ ඇස් හමුයෙහි මට ගෞරව ඇත්තේය, මාගේ දෙවියන්වහන්සේ මාගේ බලයව සිටිනසේක.)

06. එසේය, උන්වහන්සේ කථාකොට: යාකොබ්ගේ ගෝත්‍ර නැගිටවීමටත් ආරක්ෂා කරනලද ඉශ්‍රායෙල්වරුන් හැරවීමටත් නුඹ මාගේ සේවකයා වුණාට මදිය. පොළොවේ කෙළවර දක්වා මාගේ ගැළවීම වන පිණිස නුඹ අන්‍ය ජාතීන්ට එළියක් කොටද දෙන්නෙමියි කියනසේක.

# තෝරා ගැනීම

## CHOICES!


(සහෝදරී එන්ජල් කුමාරි විසිනි)




අපගේ ජීවිතය බොහෝ තෝරාගැනීම් වලින් පිරී තිබේ. සමහර තෝරාගැනීම් ඉතා වැදගත්වූවත් තවත් සමහර තෝරාගැනීම් සාමාන්‍ය දෙයකි. මෙම තෝරා ගැනීම් අපගේ ජීවිතයම වෙනස් කරන්නාවූ දේවල් වෙයි. මේ සඳහා උදාහරණයන් බැලුවහොත්, අප තෝරාගන්නාවූ සහකරු හෝ සහකාරිය, අප තෝරාගන්නාවූ රැකියාව ආදී දේ ගත හැකිය. නමුත් අපි අඳින්නේ මොනවාද? කන්නේ මොනවාද? යන සමහර තීරණ ඒකාකාරී වෙයි. දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට මැවූ විට ඔහුට සිය කැමැත්ත පාවිච්චි කිරීමට නිදහස දුන් සේක. එනම්, මනුෂ්‍යයාට තෝරා ගැනීමට ශක්තියක් තිබුණි. හොඳ හා නරක දැනගැනීමේ ප්‍රඥාව කරණකොට ගෙන යමක් තෝරා ගැනීමට ස්ව කැමැත්තක් තිබුණි. කෙසේ වෙතත් දෙවියන්වහන්සේ නිතරම උන්වහන්සේගේ බලාපොරොත්තුව සහ අප කල යුතු දේ පිළිබඳව උපදෙස් මාලාවක් දෙනු ලබයි. නමුත් උන්වහන්සේ පවසන්නාවූ දේ කරන්නය කියා උන්වහන්සේ අපට බලකිරීමට නොකරයි. අපගේම ස්ව කැමැත්තෙන් තෝරා ගැනීමට උන්වහන්සේ අපට ඉඩදී ඇත.

මේ මුළු විශ්වයම මැවූ මැවුම්කාරවූ දෙවියන්වහන්සේ අපට බොහෝ සේ ප්‍රේම කරන නිසා අපටද උන්වහන්සේට ප්‍රේම කිරීමටත් උන්වහන්සේ ගැන දැනගැනීමටත් සියලු නිදහස දී තිබේ. සර්වබලධාරී දෙවියන්වහන්සේ


3 වෙනි පිටුවට ...



Echo of His Call



Christian YouTube Channel!

An opportunity to pray with Pr. S. Sam Selva Raj!

Message & Prayer in 5 minutes!!

English, Hindi, Tamil & Telugu


Every day – 5.00 A.M.

Tamil Sunday Service – 8.30 A.M.

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

*from your dearly beloved brother...*

REACHING NATIONS



# කැඳවීමේ ප්‍රතිරාවය



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

**CHIEF EDITOR**

Pastor Alex Samson Sam, B.Th., M.Div.

**ADMINISTRATION**

Bro. N. Prakasam, M.A., General Manager
Dr. Rabinder Boaz, M.S.
Bro. K. Puratchivendan

**EDITORIAL BOARD**

Sis. Jesy Veena Sam
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Dr. A. Richard Samuel, M.A., Ph.D.
Rev. Dr. K.R. Rajasekaran

**EDITOR, PUBLISHER & PRINTER**

Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858

**E.mail ID**

sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**

www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

**YOUTUBE CHANNEL**

Echo of His Call

**"....උන්වහන්සේ ස්වකීය මුඛයෙන් කථාකරමින්... ස්වකීය හස්තයෙන් ඒක ඉෂ්ඨ කල සේක...." (1 රාජාවලිය 8-15-16)**

**ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රේමවන්තයෙනි,**

පසුගිය මාසයේ කැදැවීමේ ප්‍රතිරාවය සඟරාව කියවා ඒ පිළිබඳව ඉතාම යහපත් වූ ප්‍රතිචාරයන් අපට දක්වා ඇත. එසේ එවූ සැමදෙනාටම අපගේ ස්තූති පුද කරමි. කැඳවීමේ ප්‍රතිරාවය සේවයෙන් තමාගේ මුළු හදවතින්ම ප්‍රේම කරමින් සියලු ආකාරයෙන් උදවු උපකාර කලාවූ සැමදෙනාටම අපගේ හෘර්දයාංගයෙන්ම ස්තූතිය ඉතාම යහපත් පහත්ව පුද කිරීමට කැමැත්තෙමි. එසේම මෙම සඟරාව පිළිබඳව යහපත් වූ යෝජනාවන් ඉදිරිපත් කර යාච්ඤා කලාවූ සැමටද ස්තූති කරමි.

ඔබගේ E-Mail අප වෙත ඒවා තිබූ අතර එසේ එවූ සැම දෙනාටම E-Mail හරහා මෙම සඟරාව අපි එවමු. එසේම අපගේ Wesbite එක හරහා භාෂා 16 න්ම මෙම සඟරාව අපි නිකුත් කරමු. එම Website එක නම්. www.echoofhiscall.org ඔබ එය Wesbsite එකෙන් ලබාගෙන අන් අයටද එය ලබා දෙන්න. මෙම කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව ඔබට අනිවාර්යයෙන්ම ලැබෙන්නට සලස්වමු.

අප සැම දිනකදීම, රාත්‍රී 10.00 ට ජාත්‍යන්තර තරුණ තරුණියන් උදෙසා හා දරුවන් උදෙසා යාච්ඤා කරමු. මෙය අප ඉතාම සාර්ථක ලෙස කරගෙන යමු. මේ සම්බන්ධව අපට ඉතාම සාර්ථක පිළිතුරු ලැබී තිබේ. ඒ නිසා දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා.

මැයි මාසේදී අපගේ නිවාඩු කාලීන බයිබල් පාසල ඉතාම සාර්ථක පැවැත්වූ වෙමු. එසේම 2023 ජූනි මස 03 වන දින නෙහෙමියා බයිබල් විදුහලේ උපාධි පිරිනැමීමේ උත්සවයද ඉතාම අනර්ඝ ආකාරයෙන් පැවැත්වූවෙමු. නෙහෙමියා බයිබල් විදුහල සහ ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේශන් පාසලේ 2023 - 2024 යන වර්ෂයේ අධ්‍යයන කටයුතුද ආරම්භ කලේය. මෙම පාසැල් වල සැම පංතියකටම ඉගැන්වීමේ කටයුතු ඉතාම හොඳින් පවත්වාගෙන යාමට දෙවියන්වහන්සේගේ කරුණාව ඉල්ලා යාච්ඤා කරන්න කියාද ඉල්ලා සිටිමු.

සැම දිනකම උදෑසන 5.00 ට ඉංග්‍රීසි, හින්දි, දෙමළ, තෙලිඟු, යන භාෂාවන්ගෙන් YouTube නාලිකාව හරහා විකාශනය වෙයි. අපගේ දුරකථන අංකය +9198410 71858 ඔබගේ දුරකථනයෙහි Save කර තබා ගන්න. අපගේ සියලු සේවාවන් පිළිබඳව සියලුම තොරතුරු මෙම දුරකථන අංකයට කථාකර ලබාගත හැකිය. අපගේ කැඳවීමේ ප්‍රතිරාවය YouTube චැනලයට ඔබත් දායකවන්න.

අද ලෝකයේ තාක්ෂණය දියුණු වී ඇති නිසා අප කැමති වුවත් නැතත් අපටද ඒ සමඟම ගමන් කිරීමට සිදු වී තිබේ. මේ සියලුම ක්‍රම හරහා දෙවියන්වහන්සේගේ සුභාරංචිය සියලු දෙනා වෙතට ගමන් කරනු ලැබීම උන්වහන්සේගේ කැමැත්තයි. ස්වාමීන්වහන්සේට ස්තූති වේවා.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

පාස්ටර් සැම් සෙල්වරාජ් සහ ඇලෙක්ස් සැම්සන් සැම්

E.mail : samselvaraj333@gmail.com (+91) 98412 71858 / 98410 71858,

**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ☼ BIBLECOR - Postal Courses (3 languages) ☼ Media Ministry ☼ Online Courses ☼ Theological Correspondence Courses (2 languages) ☼ Church Planting ☼ Nehemiah Bible Colleges ☼ Gospel Printing Press ☼ Great Commission Partners ☼ St. Paul's Matriculation School ☼ Crusades ☼ Community Development

*1 පිටුවෙන්....*

කිසි විටෙකත් ඔබට තෝරා ගැනීමට බල නොකරයි. නිතරම දෙවියන්වහන්සේ මනුෂ්‍යයා සමඟ හොඳ සම්බන්ධතාවයක් පැවැත්වීමට කැමතියි. උන්වහන්සේ කිසිම බල කිරීමකින් තොරව අප ස්වාමීන්වහන්සේ වෙතට වඩ වඩා ළං වෙයි කියා උන්වහන්සේ ඉතා ඉවසීමෙන් යුතුව බලා සිටී.

යාකෝබ් 4:8 හි මෙසේ පවසයි. ***''දෙවියන්වහන්සේට ළංවෙයල්ලා. එවිට උන්වහන්සේ නුඹලාට ළංවෙන සේක...''*** (යාකෝබ් 4:8) එසේම අප උන්වහන්සේව තෝරා ගත්තා නොව උන්වහන්සේම අපව තෝරාගත්තේය කියා දේව වචනයෙහි සඳහන් කරයි. ***''නුඹලා මා තෝරාගත්තා නොව මම නුමලෘ තෝරාගෙන පත්කලෙමි...'' (යොහාන් 15:16)*** දේව වචනය තුල දෙවියන්වහන්සේව තෝරාගෙන උන්වහන්සේට ප්‍රේම කරන්නය කියා බලකර තිබෙනවාද? නැත. දෙවියන්වහන්සේ නිතරම කරුණාවෙන් පිරි දෙවියන්වහන්සේයි. අපට උන්වහන්සේ ස්ව කැමැත්ත දී තිබේ.

දේව වචනයෙහි සඳහන් කර තිබෙන්නාවූ ප්‍රධාන චරිත කීපයක් ගැන අප සලකා බලමු.

## සොරුන් දෙදෙනා

යේසුස්වහන්සේව කුරුසියේ ඇණගැසූ විටදී උන්වහන්සේ දෙපසෙ කුරුසියේ එල්ලී සිටි එක් සොරෙක් මෙසේ පැවසීය. ***''යේසුස් වහන්ස, ඔබගේ රාජ්‍යයෙන් යුක්තව ඔබ එන කල මා සිහි කල මැනව.'' (ලූක් 23:42)*** එවිට යේසුස් වහන්සේ ඔහුට මෙසේ පිළිතුරු දුන්සේක. ***''සැබෑවක් නුඹට කියමි, අදම නුඹ මා සමඟ පරාදීසයෙහි සිටින්නෙහිය.'' (ලූක් 23:43)*** නමුත් අනෙක් පස සිටී සොරා යේසුස් වහන්සේට සමච්චල් කිරීමට තීරණය කලේය. ඔහු ඔහුගේ ජීවිතයේ අවසාන මොහොතේදී යේසුස් වහන්සේට අපහාස කලේය. එක් සොරෙක් පසුතැවිලිවී ඔහුව සිහි කරන්නය කියා යේසුස්වහන්සේට පවසනු ලැබීය. නමුත් අනෙක් සොරාට අවස්ථාවක් ලැබුනද ඔහු එය ප්‍රයෝජනයට නොගෙන යේසුස් වහන්සේ ගැන වැරදි කතා කලේය. ඔවුන් දෙදෙනාටම තෝරා ගැනීමට අවස්ථාවක් ලැබුණි. කිසි කෙනෙක් ඔවුන්ට බල කිරීමක් කලේද නැත. මෙම ජීවිතය වෙනස් කරන්නාවූ තෝරා ගැනීම එම සොරාට පමණක් නොව එය අපටද අදාල වෙයි. 2023 වසරේ අපගේ තෝරා ගැනීම ගැන කථා කරනු ලබනු ලබන්නේ එම නිසාය.



## සියයකට මුලාදෑනියා

යේසුස්වහන්සේ කුරුසිපත් වූ දවසේදී සියයකට මුලාදෑනින් කීප දෙනෙක් එම ස්ථානයෙහි ඔවුන්ගේ රාජකාරියෙහි යෙදී සිටියේය. දෙවියන්වහන්සේගේ බැටළුපැටවානන්ගේ මරණයට ඔවුන් සාක්ෂිකාරයින් විය. ඔවුන් සියලු දෙනාට උන්වහන්සේගේ වෙනස දුටුවත් කිසිවෙක් උන්වහන්සේව පිළිගත්තේවත් උන්වහන්සේ ගැන කිසිම ප්‍රකාශනයක්වත් කලේ නැත. නමුත් එහි සිටි එක් සියයකට මුලාදෑනියෙක් පමණක් යේසුස් වහන්සේගේ පාදයට ඇණගැසූ විට කල්වාරි කුරුසිය ළඟ සිට ඔහු මෙසේ පවසනු ලැබීය. ***''....සැබවින්ම මුන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාය.'' (මතෙව් 27:54)*** ඔහු යේසුස් වහන්සේ කවුරුන්ද කියා ප්‍රසිද්ධියේම ප්‍රකාශ කරනු ලැබීය. එවැනි ප්‍රකාශයක් කිරීමට සැබවින්ම මහත් නිර්භීතකමක් හා ආත්ම ශක්තියක් තිබීම තිබෙන්නය අවශ්‍යයි. අද දවසේද අපගේ සහෝදර සහෝදරියන් බොහෝ දෙනෙක් විවිධාකාරවූ දුක් පීඩාවන්, කරදර, සිරගෙවල්වල සිටීම, කෑදරකම්, තමාගේම සෙනඟගේ හෝ තම ගමතුල සිටින අය තුළින් ඇතිවන පීඩාකාරී තත්වයන් තුළින් ගමන් කිරීම හෝ තවත් සමහර අයව ගින්නෙන් පුච්චා දමනු ලබයි. නමුත් මේ සැමදෙනාම ඉතා නිර්භීතව, ධෛර්‍යමත්ව ඔවුන්ගේ ඇදහිල්ල කරණකොටගෙන ස්ථිරව සිටගනී. ***''ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන්කරන්නේ කවුද? විපතවත්, සිත් වේදනාවත්, පීඩාවවත්, දුර්භික්ෂයවත්, නිර්වස්ත්‍රකමවත්,***



***උපද්‍රවයවත්, කඩුවවත් අප වෙන්කරන්නේද?'' (රෝම 8:35)*** ශුද්ධවූ පාවුලුතුමා මේ වදන් පවසනු ලැබූයේ, ඔහුගේ තෝරාගැනීමයි. එනම්, අප තෝරාගන්නාවූ දේ තුළ අප ස්ථිරවම සිටිය යුතුය.

## පිලාත්

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය ගැන වැදගත් තීරණයක් ගැනීමට පිලාත්ට සියලුම බලතල තිබුණි. නමුත් ඔහු මනුෂ්‍යයන් සතුටු කිරීමටත් ඔවුන්ගෙන් ඉතා හොඳ නම්බුනාමයක් ලබා ගැනීමටත් යුදාවරුන්ගෙන් හොඳ නාමයක් ලබා ගැනීමටත් අවශ්‍ය වූ නිසා ඔහු කලයුතු දේ කලේ නැත. දේව වචනයෙහි මෙසේ පවසයි. ***''කරුණාව පෙන්වන්ට නුඹේ අතෙහි බලය තිබියදී, ඕනෑකරන අයගෙන් එය වළක්වා නොගනින්න.'' (හිතෝපදේශ 3:27) ''එබැවින් අප ප්‍රස්තා ඇති හැටියට සියල්ලන්ටම ප්‍රධාන කොට ඇදහිල්ලේ පවුලට අයිති වූවන්ට, යහපත්කම්කරමු.'' (ගලාති 6:70)*** නැවත මෙය අපට දී තිබෙන්නාවූ නිදහසයි. අපගේ හෘදය සාක්ෂියට එකඟව හොඳ තීරණයක් ගන්නය කියා දේව වචනයෙහි පවසා ඇත.

දෙවියන්වහන්සේ ඔබව උසස් ස්ථානයක තබා තිබේ නම්, ඔබ කැඩී බිඳී සිටින, අවශ්‍යතාවයන්ගෙන් සිටින, උදවු උපකාරයක් නොමැති, කිසිම බලතලයක් නැති, නිවහනක් නැති, ශාරීරිකව හා මානසිකව අසරණව සිටින අයට උදවු උපකාර කිරීම පිළිබඳව හරි තීරණයක් ඔබගේ හෘදය සාක්ෂියට එකඟව ගත යුතුය. නිවැරදි දේ උදෙසා සටන් කරන්නාවූ නායකයන් අපට අවශ්‍යයි. තෙරේසා මවුතුමිය ඉතා අනර්ඝවූ කාන්තාවකි. ඇගේ මුලු ජීවිතයම දුගී දුප්පත් අසරණ අය උදෙසා පූජා කලේය. එසේම එම් කාර්මයිකල් නැමති තැනැත්තියද ඉතාම වැදගත් වූ චරිතයකි. ඇය තරුණ ගැහැණු ළමුන්ගේ අයිතිවාසිකම් උදෙසා සටන් කලේය. මොවුන් උපකාරයක් අවශ්‍ය දුර්වල අයට හා සමාජයේ අසාධාරණයන්ට ගොදුරු වූ අයට මුළු හදවතින්ම උපකාර කලාය. අද ඉතාම දුකට පත්වෙන්නාවූ කාරණයක් නම්, තමාගේ සහෝදර සහෝදරයින් විඳින දුක් වලට මැදිහත්වී උපකාර කිරීමට බලතල තිබුනද ඔවුන් එය තෝරාගෙන නැත. තවත් දුකට පත්වන කාරණයක් නම්, කිතුණු සභාවන් පවා මේ දෙයට මුල් තැන දෙන්නේ නැත. ස්වාමීන්වහන්සේගේ කරුණාවෙන් මෙවැනි අයව වෙනස් කරන්නය කියා අපි ඉල්ලමු.

යේසුස් වහන්සේ නිර්දෝශීය කියා පිලාත් දැනගෙන සිටියේය. යේසුස් වහන්සේව නිදහස් කිරීමට ඔහුට තෝරාගැනීමක් කිරීමට හැකියාව තිබුණි. ඇත්තෙන්ම ඔහු යේසුස් වහන්සේව නිදහස් කිරීමට කැමති විය. නමුත් එය ප්‍රසිද්ධ කිරීමට කැමති වූයේ නැත. එම නිසා ඔහු ඉතා සූක්ෂම ලෙස ඔහු ගත යුතු තීරණය මනුෂ්‍යයන් විසින්ම ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙමින් නිදහස් කරයි කියා ඔහු සිතුවත් සෙනඟ ඉල්ලනු බරබ්බස්ව නිදහස් කරන ලෙසයි. නැවත පිලාත් වැරදි තේරීමක් තෝරා ගත්තේය. ඔහුට ලැබුණු අවස්ථාව ඔහු අහිමි කරගත්තේය.

අපගේ ජීවිතයේද අපට ලැබුණාවූ යම් යම් අවස්ථාවන් අප අහිමි කරගෙන තිබෙනවාද? එයට හේතු අප තෝරාගත යුතු අවස්ථාව අප මගහැර ගෙන තිබේ. අපට අතපසු වුවත් ස්වාමීන්වහන්සේ නිතරම දෙවියන්වහන්සේගේ සැළසුම අප කෙරෙහි තබා ඇති අතර උන්වහන්සේ ප්‍රේමයද අප කෙරෙහි වගුරා ඇත. ''මීට පෙර මට මේ කරන්න තිබුණා. දැන් මම වයසට ගිහින්, මගේ බලයත් මට නැහැ. මගේ ජීවිතයේ වසර ගණනාවක්ම නාස්ති වුණා'' කියා සමහර විට ඔබ සිතනවා ඇත.

නමුත් ප්‍රිය සහෝදරයා සහෝදරිය ඔබගේ ජීවිත කාලය නාස්තිවුවා කියා ඔබ සිතනවා නම්, දේව රාජ්‍යයට ඔබ තවමත් ප්‍රමාද නැත. දෙවියන්වහන්සේ මෝසෙස්ව අවුරුදු 40 දී පාවිච්චි කලේ නැත. නමුත් උන්වහන්සේ ඔහුව අවුරුදු 80 දී පාවිච්චි කරනු ලැබීය. ඔබගේ ගෙවී ගියාවූ සියලු වසරවල් උන්වහන්සේට භාර දෙන්න උන්වහන්සේ එය රැගෙන ඔබට ඉතා අලංකාර වූ කාලයන්

*6 වෙනි පිටුවට....*

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ජූලි:19-** නෙහෙමියා බයිබල් විදුහල,ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහල සහ දේවධර්ම ඩිප්ලෝමාවට අදාළ සියලුරු ක්‍රියාකාරකම් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:20-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ සෑම සහකාර කතෘ වරුන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:21-** නෙහෙමියා බයිබල් විදුහලට නවක සිසුන් ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:22-** විවිධ සේවාවන් වල යෙදෙන දේව සේවකයන්ගේ උසස් කැපවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:23-** යාච්ඤා මැදිහත්කරුවන් ඇතුළු සියලු අංශ භාරව කටයුතු කරන ප්‍රධාන සේවා නායකයින් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:24-** කැඳවීමේ ප්‍රතිරාවය නිර්මාතෘ පාලක සෑම් සෙල්වරාජ් ඇතුළු සියලුම සහකාර දේව සේවකයන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:25-** කැඳවීමේ ප්‍රතිරාවය මුද්‍රණාලයේ සේවය කරන අය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:26-** 1969 වසරේ සිට අඛණ්ඩව පවත්වාගෙන යන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:27-** දේව රාජ්‍යයට ඇදහිලිවතුන් ලැබීමත් එහි වර්ධනය ගැනත් ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:28-** අලුතින් ආරම්භ කරන ලද ශාඛා සභා වෙත නවක ඇදහිලිවතුන් පැමිණීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:29-** නෙහෙමියා බයිබල් විදුහලට සහ ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලට 2023 2024 වර්ෂ සඳහා සිසුන් ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:30-** ළමා සහ තරුණ සේවා සඳහා තිබෙන ලෝක දර්ශනය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:31-** කැඳවීමේ ප්‍රතිරාවය U Tube සමාජ ජාලයට අලුතින් මනුෂ්‍යයන් සම්බන්ධ වන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:01-** බොහෝ ප්‍රදේශ වෙත ශුභාරංචිය ලැබෙන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:02-** නෙහෙමියා බයිබල් විදුහලේ විදුහල්පති තුමා සහ ගුරුවරු ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:03-** සභා පාලකවරුන් සහදේවස්ථාන කාර්ය මණ්ඩලය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**අගෝ:04-** දෙවියන්වහන්සේගේ අනුග්‍රහය සියලුරුම ඇදහිලිවතුන් මත වැගිරෙන පිනිස යාච්ඤා කරන්න

**අගෝ:05-** නිවාඩු කාලීන බයිබල් විදුහල තුළින් නවක දරුවන් 100 කට දෙවිඳුන්ගේ ස්පර්ශය ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**අගෝ:06-** මිෂනාරිවරුන්ට සහදේව සේවකයන් වෙත පැමිණෙන පීඩා කරදර නැවතෙන පිනිස යාච්ඤා කරන්න

**අගෝ:07-** යලි හිස ඔසවන කොරෝනා වසංගතය පැතිරීම ගැන යාච්ඤා කරන්න

**අගෝ:08-** කිතුණු පවුල් අවුල් කරන සාතන්ගේ භේදභින්න කිරීමේ ආත්මය ගැන යාච්ඤා කරන්න

**අගෝ:09-** දේව වචනය සහ දේව ආත්මය තුළින් කිතුණු දරුවන් විශේෂ ආශිර්වාද ලබාගන්න පිනිස යාච්ඤා කරන්න

**අගෝ:10-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ 55 වන සංවත්සරය ගැන යාච්ඤා කරන්න

**අගෝ:11-** ආර්ථික බාධා වලින් පෙලෙන සෑම කිතුණුවෙක්ම ඉන් නිදහස් වන පිනිස යාච්ඤා කරන්න

**අගෝ:12-** දේව සේවය තුළ මුහුණ දෙන ආර්ථික අවශ්‍යතා ගැන යාච්ඤා කරන්න

**අගෝ:13-** සෑම මනුෂ්‍යයන්ගේ අවශ්‍යතා ගැන යාච්ඤා කරන්න

**අගෝ:14-** සහෝදර ඉන්ද්‍රජිත් රෝයි ඉක්මනින් සුවය ලබාගන්නා පිනිස යාච්ඤා කරන්න

**අගෝ:15-** දේව සේවකයන් සහ ඔවුන්ගේ පවුල් වල අය නිරෝගි සුවයෙන් සිටින පිනිස යාච්ඤා කරන්න

**අගෝ:16-** කැඳවීමේ ප්‍රතිරාවය මාධ්‍ය අංශය තුළින් කරන විකාශන ගැන යාච්ඤා කරන්න

**අගෝ:17-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ නිර්මාතෘ සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය ගැන යාච්ඤා කරන්න

**අගෝ:18-** නෙහෙමියා බයිබල් විදුහලේ අන්තර්ජාලය තුළ පොත් කියවීමට සකස් කර ඇති මෘදුකාංගයට අලුත් එකතුවීම් ගැන යාච්ඤා කරන්න.

4 පිටුවෙන්....

ලබා දෙනු ඇත. ඉතා පැරණි ගීතයක මෙසේ සඳහන්ව ඇත.

''සියලුම දේ යේසුස් වහන්සේට භාර දෙන්න. ඔබගේ සුනුවිසුනු වී ඇති සිහින තුවාල වූ හදවත යන සියල්ලම යේසුස් වහන්සේට භාර දෙන්න. ඔබගේ දුක ස්වාමීන්වහන්සේ ප්‍රීතියට හරවන සේක'' අපගේ හැම සියලු දේම යේසුස් වහන්සේට භාර දෙමු.

# පේතෘස්

පේතෘස් යේසුස් වහන්සේගේ මුල්ම ගෝලයින් අතරින් එක්කෙනෙකි. ඔහු යේසුස් වහන්සේ ළඟින්ම සිටියාවූ ගෝලයින් තිදෙනාගෙන්ද එක්කෙනෙකි. එසේම යේසුස් වහන්සේගේ ජීවිතයේ වැදගත් වූ අවස්ථාවන් වලදීද ඔහු සිටියේය. යේසුස් වහන්සේ අන් වෙසක් වූ අවස්ථාවේදී පවා ඔහු යේසුස් වහන්සේ සමඟ සිටියේය.

පේතෘස්ගේ චරිතයට මා බෙහෙවින් ප්‍රිය කරමි. ඔහු ඉතා නිර්භීත පුද්ගලයෙකි. කඳු මුදුනේදී යේසුස් වහන්සේ අන් වෙසක් වූ අවස්ථාවේදී යේසුස් වහන්සේටත්, මෝසෙස්ටත් හා එළියාටත් නැවතීමට ඔහු කුඩාරමක් සෑදීමට සූදානම් විය. යේසුස් වහන්සේ උන්වහන්සේගේ මරණය ගැන කථා කල අවස්ථාවේදී පේතෘස් ඉතා හැඟීම් බරව මුලින්ම කථා කර මෙසේ පවසනු ලැබීය. ''ස්වාමිනී, මා ඔබ සමඟ සිරගෙදරට යාමට හා මරණය විඳීමට පවා සූදානම්'' ඔහු ඉතා කඩිසර මෙන්ම ඉතා ඉක්මනින්ම කෝප වෙන්නාවූ පුද්ගලයෙකි. යේසුස් වහන්සේ සොල්දාදුවන් විසින් අත් අඩංගුවට ගත් විටදී ඔහු කෝපයට පත් වී එක් සොල්දාදුවෙකුගේ කන කඩුවෙන් කපා දමනු ලැබීය. එසේම ඔහු හැඟීම්බර පුද්ගලයෙක් මෙන්ම සෑම විටම ඉදිරියට යන්නාවූ පුද්ගලයෙක්ය.

පේතෘස් මනුෂ්‍යයන් සමඟ ඉතා හොඳ සම්බන්ධතාවයක් තිබූ පුද්ගලයෙකි. ඔහුගේ සහෝදරයා වූ ඇන්ඩෘ සමඟද ඔහුට ඉතා හොඳ සම්බන්ධතාවයක් තිබුණි. මන්ද ඇන්ඩෘ යේසුස් වහන්සේව දුටු විටදී 'එන්න, උන්වහන්සේ බලන්න යන්න' කියා පැවසූ විටදී ඔහු එවලේම යේසුස් වහන්සේ දැකීමට ඔහුත් සමඟ ගියේය. එසේම ඔහු තමාගේ පවුලට ඉතාම සමීපව සිටි පුද්ගලයෙකි. මන්ද ඔහුගේ නැන්දම්ම අසනීපයෙන් සිටි අවස්ථාවේදී ඇයට යාච්ඤා කරන පිණිස යේසුස් වහන්සේ නිවසට ගෙන ගියා. එපමනක්ද නොව ඔහු යේසුස් වහන්සේ ඉතා හොඳින්ම හඳුනාගෙන සිටි නිසා 'යේසුස් ක්‍රිස්තුස්වහන්ස ඔබවහන්සේ ජීවමානවූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාය. පැමිණෙන්නට සිටින මෙසායාය.'' කියා පවසනු ලැබීය.

මෙවැනි කැපවීමක් සෙනඟගේ ප්‍රේමණීය පුද්ගලයෙක් ලෙස සිත දිනාගත්තාවූ යේසුස් වහන්සේට විශාල ගෞරවයක් දැක්වූවාවූ පුද්ගලයෙකු යේසුස් වහන්සේ හඳුනන්නේ නැහැ කියා පැවසුවේ කෙසේද? ඔහු එක් වතාවක් නොව තුන් වතාවක්ම යේසුස් වහන්සේට හඳුනන්නේ නැහැ කියා පැවසීය. ඔහු මෙසේ පැවසීමට පෙර, 'නුඹ තුන් වතාවක් මාව හඳුනන්නේ නැහැ කියා පවසනු ඇතැයි' කියා යේසුස් වහන්සේ කලින්ම ප්‍රකාශ කරනු ලැබීය. එපමනක්ද නොව ඔහු යේසුස් වහන්සේට ශාප කලේය. මෙය කියවන විටදී අප පේතෘස්ව විනිශ්චය කරමින් ඔහු වැරදි කාරයෙක්ය කියාත් ඔහු ඉතාම නපුරුවූ පුද්ගලයෙක්ය කියාත් සිතන්නට පුළුවන, නමුත් අපද යේසුස් වහන්සේට අපගේ ජීවිතය කැපකර උන්වහන්සේව අනුගමනය කරන නමුත් අපගේ ක්‍රියාවන් වචන හා සිතුවිලි තුළින් යේසුස් වහන්සේට නොහඳුනන ලෙස ක්‍රියා කරමින් සිටිනවාද කියා මොහොතක් සිතන්න. මා ක්ෂණිකවම ලිස්සා වැටුනාය කියා සමහරු පවසන ආකාරය මා අසා ඇත. එසේම අප කී දෙනෙක් පේතෘස්වත් මෙලෙස වැරදී ලිස්සා වැටුනේය කියා සිතනවාද? ඔහුගේ ජීවිතය කරණකොට ගෙන අප සෑම පාඩමක් ඉගෙන ගන්නවාට මා කැමතියි.

මා විශ්වාස කරනවා, යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අඳුනන්නේ නැහැ කියා පැවසීමට, මෙවැනි කැපවීමක් කලාවූ උන්වහන්සේට අතිශයෙන් ප්‍රේම කලාවූ සෑම විටම ඉදිරියට ගියාවූ කෙනෙක්ට මෙය ලෙහෙසි පහසු වූ දෙයක් නොවේය කියා. මතෙව් 26:58 හි පවසන්නාවූ ආකාරයට පේතෘස්ගේ මෙම වැටීම ආරම්භ වූයේ ඔහු යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ඉතාම දුරින් ගමන් කල නිසාය කියා දේව වචනයෙහි පවසයි.

පේතෘස් යේසුස් වහන්සේට දුරින් උන්වහන්සේ පසුපස ගියාය කියා දේව වචනයෙහි පවසයි. අප බොහෝ දෙනෙක් යේසුස් වහන්සේට ප්‍රේම කරයි. උන්වහන්සේගේ ආශිර්වාදයන් භුක්ති විඳියි. එසේම උන්වහන්සේ අපට සපයන්නාවූ අපව ආරක්ෂා කරන්නාවූ තැනැන්වහන්සේය කියා අපි දන්නා නමුත් අප ගමන් කරනුයේ උන්වහන්සේට බොහෝ ඈතින්ය. එසේ දුරින් ගමන්කරන එක හොඳයි කියා සමහරු සිතන්නට හේතුව වන්නේ, මිනිසුන් අප යේසුස් වහන්සේ සමඟ ගමන් නොකරන බව සිතන

නිසාය. නමුත් අද අපි කී දෙනෙක් උන්වහන්සේ සමඟ ළඟින් ගමන් කරනවාද? අප කී දෙනෙක් උන්වහන්සේ ළඟින් ගමන් කිරීමට කැමතිද?

මිත්‍රවරුනි, අපට එකම වේලාවේදී මේ ලෝකයටත්, ස්වාමීන්වහන්සේටත් ප්‍රේම කිරීමට නොහැකිය. ''කාමමිථ්‍යාචාරික තැනැත්තියනි, ලෝකය සමඟ මිත්‍රකම දෙවියන්වහන්සේට සතුරුකම බව නුඹලා දන්නේ නැද්ද?...'' (යාකෝබ් 4:4) එසේනම් අප ළඟින් ගමන් කල යුතුය. නැතිනම්, දුරින් ගමන් කල යුතුය. ඒ අතර මැද මැදින් ගමන් කරනවාය කියා ගමනක් නැත. අප යේසුස් වහන්සේට ළඟින් ගමන් නොකර උන්වහන්සේට දුරින් ගමන් කරනවා නම් අප කොතරම් ආත්මික පුද්ගලයෙක් වුවත් එය ප්‍රයෝජනයක් නොමැත. මන්ද එය අපගේ ජීවිතයට භයානක වූ තත්වයකි.

අද ක්‍රිස්තුස්වහන්සේ සමඟ අද ඔබගේ ඇවිදීම කෙසේද? ඔබ යේසුස් වහන්සේ සමඟ ගමන්කරනු ලබන්නේ ළඟින්ද? එසේත් නොමැතිනම් දුරින්ද? කියා අප සැම දෙනාම තෝරා ගත යුතු වූ දෙයකි. මෙය මා පෙර සඳහන් කල ආකාරයට, යේසුස් වහන්සේ අපට ප්‍රේම කරන නුමුත් උන්වහන්සේ අප කිසි කෙනෙකුට කිසි දෙයක් පිළිබඳව බල කිරීමක් කරන්නේ නැත. උන්වහන්සේ අපට ස්ව කැමැත්ත දී ඇත. නමුත් උන්වහන්සේගේ ආශාව පිළිබඳව උන්වහන්සේ මෙසේ පවසයි. ''නුඹලා මා තුළෙහි පවතින්නේ නම්, මාගේ වචනය නුඹලා තුළෙහි පවතී නම්, නුඹලා කැමති දෙයක් ඉල්ලාපල්ලා, එවිට නුඹලාට ලැබේ.'' (යොහාන් 15:7) යේසුස් වහන්සේ සමඟ ඉතා ළඟින් ගමන් කිරීමේ වැදගත් භාවය අපට මෙයින් තේරුම් ගැනීමට හැකිය.

ප්‍රිය මිත්‍රවරුනි, අද අප ජීවත් වෙන්නාවූ ලෝකය ඉතා කැළඹිලිකාරය. අපගේ පවුල් අපගේ පුද්ගලික ජීවිත ඉතාම අභියෝගයකට පත් වී ඇත. සමහර විට අපගේ ජීවිතයේ අප මුහුණ දෙනු ලබන අධෛර්‍යයකම්, වේදනා, මිනිසුන්ගේ පාවාදීම්, මරණය, පිටුපසින් අපට අනින්නාවූ ඇනුම් නිසා අප මානසිකව වැටීමට හැකිය. මෙවැනි තත්වයක ඔබ කී දෙනෙක් සිටිනවාද? කියා මා නොදනිමි . යම් කෙනෙක් නිසා තමයි මෙසේ ජීවත් වෙන්නේ කියා ඔබ පැවසීමට හැකිය. මෙවැනි දේ නිසා ඔබ ක්‍රිස්තුස්වහන්සේ සමඟ ගමන් කිරීම නතර කරනවා ඇත. සමහර විට ඔබ යුදාස් මෙන් හෝ පේතෘස් මෙන් විය හැකිය. දෙදෙනාම ඈතින් ගමන්කරනු ලැබීය. මේ දෙදෙනාම භයානක තත්වයක සිටීය.

පේතෘස් යේසුස් වහන්සේව අඳුනන්නේ නැත කියා පැවසීම ක්ෂණිකව සිදුවූ දෙයක් නොව එය ටිකෙන් ටික සිදු වූ දෙයකි. එනම්, යේසුස් වහන්සේව සොල්දාදුවන් අල්ලාගත් විටදී සියලු දෙනාම මහත් කැළඹීමකට පත් විය. ඔවුන්ගේ හදවත් තුල අනිසි භියක් ඇති විය. නමුත් තමාගේ ස්වාමියාට කුමක් සිදුවන්නේද කියා දැනගන්නා පිණිස පේතෘස් දුරින් ගමන්කරනු ලැබීය.

ඔබත් පේතෘස් මෙන්ද? මා යේසුස් වහන්සේ ළඟින් ගමන් කලහොත් මා ගැන බලාපොරොත්තුවන දේ ඉහළ මට්ටමක තිබිය යුතුය, කියා සිතන බැවින් දුරින් ගමන් කරන එක හොඳයි කියා ඔබ සිතන්නට පුළුවන. සමහර පුද්ගලයින් දේවස්ථානයට පැමිණුනත් එහි පවත්වන්නාවූ සමහර වැඩසටහන් වලට සහභාගී නොවනු ඇත. තවත් අය දේවස්ථානයට නොගොස් නිවසෙහිම රැඳී සිටිති. නිවසේ සිට යාච්ඤා කරති. තවත් අය හැම විටම යාච්ඤා නොකරන අතර අවශ්‍යතාවයක් තිබුණහොත් පමණක් යාච්ඤා කරති. අපට යේසුස් වහන්සේට දීමට කාලයක් නොමැත කියා පවසති.

මා ඔබව ධෛර්‍යයමත් කිරීමට කැමැත්තෙමි. උන්වහන්සේ මේ ලෝකයට පැමිණුනේ මනුෂ්‍යයාව දෙවියන්වහන්සේ හා සමඟ සහභාගීකම් පවත්වන පිණිස සමගි කිරීමටයි. ඒ පිණිස උන්වහන්සේ කුරුසියේ මරණයට පත් විය. එසේම අප වැටී සිටින තත්වයන් තුළ අපට බලාපොරොත්තුවක් දෙන පිණිසත් කුණාටු මැද සමාදානයෙන් සිටින

10 වෙනි පිටුවට....

Pray for NEHEMIAH BIBLE
RESIDENTIAL / EVENING COLLEGE,
Velachery / Chepauk & Santhoshapuram, Chennai.
Medium : Hindi / Tamil
Registered Candidate for Membership
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders &
Senior Pastors for the past 53 years
Qualification : 10th Standard & above
Rush for admission!
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**''...කියවන්නා තේරුම් ගනීවා....''** *(මතෙව් 24:15)*

# මගේ ජීවිතයේ දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම හා දේව ආරක්ෂාව

*''උන්වහන්සේ තමන් කෙරෙහි භය ඇත්තන්ගේ ආශාව ඉෂ්ඨකරදෙනසේක...'' (ගීතාවලිය 145:19)*

## HIS GUIDANCE AND PROVIDENCE IN MY LIFE!

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහත් වූ කරුණාව හා දයාව නිසා 1982 වන වර්ෂයේදී වෙන්නෙයි චේපාක් යන ස්ථානයේදී සේවයක් ආරම්භ කිරීමට දෙවියන්වහන්සේ අප හට උපකාර කලේය. නමුත් අපට එම සේවය කරගෙන යන පිණිස ස්ථිර තැනක නොතිබුණ නිසා විටෙන් විට සේවය සඳහා ස්ථාන මාරු කිරීමට සිදු වූ නිසා යම් ගැටළුකාරී අවස්ථාවන් වලට මුහුණ දීමට සිදුවිය. එපමනක්ද නොව මෙම පලාත තුල ආර්ථික ප්‍රශ්න සෙනඟගෙන් ඇතිවූ විරුද්ධතාවයන්, ඊර්ෂ්‍යාව ආදී විවිධාකාර දේවල් අපට විරුද්ධව බලපෑවේය.

අවසානයේදී මෙම පලාතේ කුඩා නිවසක කුඩා කාමරයක් තුළ අප අපගේ ඉරුදින දේව මෙහෙය පැවැත්වීමට පටන්ගත්තේය. මෙම නිවස අයිතිව සිටි සහෝදරයා වූයේ ජෝර්ජ් නැමති මහත්මයෙකි.

එක්තරා ඉරුදිනක අප නමස්කාරයෙන් යුතුව සිටි අතරතුරේදී ශුද්ධාත්මයාණන්වහන්සේ ඉතා බලවත් ලෙස මාව පොළොඹවමින් මෙම පලාතෙහිම අපගේ සභා දේව මෙහෙයන් පවත්වාගෙන යන පිණිස අපටම කියා ගොඩනැගිල්ලක් දෙන්නට යන බව උන්වහන්සේ මට හැඟෙව්වේය. එසේම එම කාරණාව යාච්ඤාව පවත්වාගෙන යන විටදී සෙනඟ සමග බෙදාගන්නා ලෙසද මගපෙන්විය. මා ස්වාමීන්වහන්සේට කීකරු වී එම පණිවිඩය සභා දේව මෙහෙයදී බෙදා ගත්තෙමි.

★ සභාවේ සිටි සෙනඟ මා පැවසූ දෙයට ඇහුම්කන් දුන් නමුත් ඔවුන් බැලූ බැල්මෙන්, මට හැඟුනේ ඔවුන් මා විහිළුවකට ගත් බවකි.

★ ''අපට තිබෙන්නාවූ අඩු ආර්ථික තත්වය මත මෙලෙස ඉඩමක් මිලදී ගැනීමට හැකිද?'' කියා ප්‍රශ්න කලේය.

★ තවත් සමහරු මට බලපෑම් ඇති කරමින් ''අපට මුල් තිබුණත් මෙම බලාත ඉතා ජනාකීර්ණ නිසා ඉඩමක් මිලදී ගන්නේ කෙසේද?'' කියා ඇසුවේය.

සමහර මිත්‍රයින් මා වෙතට පැමිණ ඉතා සැක සහිත ප්‍රශ්නයක් ඇසුවේය. එනම්, ''දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක් හැටියට මෙවැනි දෙයක් සෙනඟට පවසන එක හරිද? මෙවැනි පණිවිඩ දීමෙන් දෙවියන්වහන්සේව අපහාසයට පත් කරනවා'' යනුවෙනි.

මේ සියලුම කාරණාවන් ඇසූ විට මා ඉතාම කැළඹිල්ලට පත්වූයෙමි. මේ සඳහා මා සමඟ සිටගැනීමට හැකි එක් පුද්ගලයෙක්වත් සිටියේ නැත. මගේ ඇදහිල්ලේ අභියෝගය නිසා සෙනඟ, කිතුණු දේශකයින්ට වෙන රැ කියාවක් නොමැති නිසා ඔවුන් විශ්වාස කිරීමට බැරි ලබාගත නොහැකි සුරංගනා කථා පතුරුවනවාය කියා සෙනඟ සිතූ අතර ඔවුන් කිසිවෙක්වත් මාව සැලකුවේ නැත.

නමුත් මේ කිසිවක් නිසා මා කල කිරීමට පත්වූයේ නැත. දෙවියන්වහන්සේ මාන සනසා උන්වහන්සේගේ කරුණාව මා හට බලවත් ලෙස ලබා දුන්නේය. ඇදහිල්ලේ කර්තෘ සහ සම්පූර්ණකරන්නාවූ දෙවියන්වහන්සේ ***(හෙබ්‍රෙව් 12:1)*** මාව ශක්තිමත් කලේය. තවද උන්වහන්සේගේ වචනයෙන් මාව ධෛර්‍යමත් කලේය.

***''පණුවෙක් වැනි වූ යාකෝබ් නුඹද ඉශ්‍රායෙල් මනුෂ්‍යයෙනි නුඹලාද භය නොවෙල්ලා, මම නුඹට පිහිටවන්නෙමියි ස්වාමීන්වහන්සේ කියනසේක. නුඹේ මිදුම්කාරයාණෝ ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන්වහන්සේය. බලව, මම නුඹ මුවහත්වූ අලුත් දැති ඇත්තාවූ මඩින යන්ත්‍රයක් කරන්නෙමි. නුඹ කඳු මැඩ, පොඩිකර, හෙල් බොල් මෙන් කරන්නෙහිය.'' (යෙසායා 41:15-15)***

කාලය කෙමින් ගෙවී ගියේය. දෙවියන්වහන්සේ මා හට ආශිර්වාද කරමින් මෙවැනි දේ මෙවැනි අශුභවාදී දේ කථා කලාවූ සැමදෙනා ඉදිරියේ අප සිටිය ස්ථානයෙහිම ඉඩමක් ලබා දුන්නේය.නමුත් එම ඉඩම ලබා ගැනීම පිණිස අප සතුව මුදල් තිබුනේ නැත. මා දන්නා හඳුනන සෑම ස්ථානයකින්ම මුදල් ලබා ගැනීමට උත්සාහ කලද එය අසාර්ථක විය. මා එම කාල වකවානුව තුලදී රාජ්‍ය සේවකයෙකු ලෙස රැකියාවක නියුතු වූ බැවින් රජය විසින් මා හට පුද්ගලික ගොඩනැගිලි අත්තිකාරම් මුදලක් ලබා දෙමින් එම ඉඩම ලබා ගැනීම පිණිස ඉදිරිපත් විය. දෙවියන්නවහන්සේව නොදන්නාවූ මාගේ මිත්‍රයෙක් වූ කන්නන් සහ තවත් කිතුණු මිත්‍රයෙක් වූ රජය කුමාර් තුළින් මෙය ලබා ගැනීමට ස්වාමින්වහන්සේ මා හට උපකාර කලේය. සැම විටම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යහපත්ය. අපට සිටින්නේ කොපමන යහපත් වූ ස්වාමින්වහන්සේ කෙනෙක්ද?
***''ස්වාමීන්වහන්සේ යහපත් බව රසබලා දැනගන්න...''***
***(ගීතාවලිය 34:8)***

මා මෙම පණිවිඩය ඔබට ලියන්නාවූ මෙම අවස්ථාවේදී පවා මා ජීවිතයේ බොහෝ අභියෝගයන් රැසකට මුහුණ දෙමින් සිටිමි. තවද විවිධාකාර වූ ප්‍රශ්න රැසකටම මැදිවී දෙවියන්වහන්සේ දුන්නා වූ සේවයෙහි යෙදී සිටිමි. එසේම සැම දිනකදීම කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව භාෂා 16 කින් නිකුත් කිරීම, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, භාෂා 3 කින් පවත්වන පුහුණු කිරීමේ පාඩම් මාලාව, නෙහෙමියා බයිබල් විදුහල, ප්‍රධාන සභාවේ පවත්වනු ලබන දේව මෙයෙන් 7, ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසල, ශුභාරංචි පත්‍රිකා මුද්‍රණය කරනු ලබන්නාවූ මුද්‍රණාලය මීට අමතරව කාර්යාලයේ වැඩකටයුතු පරිපාලනය ආදී සෑම සේවයකම මා හට බොහෝ ප්‍රශ්න හා අභියෝගයන් සැමදාම තිබේ.

බොහෝ රාත්‍රීන් මට නින්දක් නොමැත. සමහර රාත්‍රීන් වලදී නිදා ගැනීමටද මා නොකැමැත්තෙමි. මා එක් දෙයක් ඉගෙන ගතිමි. එනම්, මාගේ එකම බලාපොරොත්තුව නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පමණක්ම බවයි. මා ගැන සලකන සැබෑ මිතුරන් පවා ලෝකයේ අන්ධකාරයෙන් වටකර ඇති අතර නපුරු බලවේගයන්ද ඔවුන්ට විරුද්ධව ක්‍රියා කරයි. නමුත් මෙවැනි අවස්ථාවකදී මට ඇති එකම බලාපොරොත්තුව උන්වහන්සේගේ මඟපෙන්වීම හා දේව ආරක්ෂාව පමණි. පැරණි ගීයක මෙසේ පවසයි. ''ස්වාමිනි, ඔබගේ ආලෝකය මා යන අඳුරු මාර්ගයේදී මට මඟපෙන්වන්න, අඳුර ඉතාම ඝනව ඇත. මාගේ නිවසින් මා ඈත්ව සිටිමි. මට මඟපෙන්වන්න!
මාගේ පාදය ආරක්ෂා කල මැනව, ස්වාමිනි, මට අවශ්‍ය අද ඇති දේ නොව සැම විටම එක් එක් පියවර ගැනීමට, මට උපකාර කල මැනව.''

මා දන්නවා දිනපතා මගේ ජීවිතයේ බොහෝ අමාරුකම් හා සෝදිසි ඇති බව නමුත් මට ඇති බලාපොරොත්තුව නම් මේ ලෝකයේ වැඩ නිමාකල විටදී මා දේව රාජ්‍යයට ඇතුලු වනු ඇත. එහිදී මගේ ස්වාමින්වහන්සේව මා මුහුණට මුහුණ හමුවෙයි. එවිට මේ ලෝකය තුල මා ලැබූ අත්දැකීම් උන්වහන්සේ සමඟ බෙදා ගනිමි. එම අලංකාර දවස ගැන මා ඉතා ආශාවෙන් බලා සිටිමි. එම දවස ඉතාම අනර්ඝය. එය ආශිර්වාද ලත් දවසකි.

මිත්‍රය, ඔබටත් එවැනි බලාපොරොත්තුවක් තිබේද? ඒ ගැන ඔබටත් ආශාවක් තිබේද?

***


The Lord has done great things for us, whereof we are glad – Psalm 126:3.

**ECHO OF HIS CALL**
***Ministries***

**55th ANNIVERSARY**
*(1969 - 2023)*

Place:
**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET,
CHEPAUK, CHENNAI - 600 005, INDIA.

**Special Progammes on**
**11.08.2023, Friday**
**12.08.2023, Saturday**
**13.08.2023, Sunday**

**Special message :**
**Pastor ANGELINE SELVAKUMARI**

**Please Pray!**

Contact: Pastor S. Sam Selva Raj, (+91) 98410 71852



**A good opportunity to get**
**Echo of His Call**
**monthly magazine at free of cost**

If you could send the addresses of your friends / relatives through post, letter, e.mail, WhatsApp or phone to us, we will dispatch **Echo of His Call** monthly magazine to them at free of cost.

*7 වෙනි පිටුවෙන්....*

පිණිසත් හා අපට ප්‍රේම කරන පිණිසත්ය. ''තමන්වහන්සේගේම පුත්‍රයා ඉතුරුකර නොගෙන අප සියල්ලන් උදෙසා පාවාදුන්නාවූ තැනැන්වහන්සේගේ පුත්‍රයා ඇතුළුව අනිකුත් සියල්ල අපට නොදෙන්නේ කෙසේද?'' (රෝම 8:32) උන්වහන්සේගෙන් ඉල්ලන්න. උන්වහන්සේ ඔබට යහපත් වූ දේ සපයා දෙනු ඇත.

උන්වහන්සේට සැමදිනකදීම කථා කරන්න. දේව වචනය කියවන්න. උන්වහන්සේගේ හඬට ඔබ ඇහුම්කන්දී නොමැති නම්, උන්වහන්සේගේ හඬ අසන්න. මෙම යාච්ඥාව කරන්න. ''ස්වාමීනි, මට ඔබවහන්සේ සමඟ දුරින් නොව ළඟින් ගමන් කිරීමට අවශ්‍යයි. මට කථා කරන්න. ඔබගේ හඬ මට ඇසෙන්නට ඕනි. මට උපකාර කරන්න. ස්වාමීනි, ඔබට ඇහුම්කන්දීම පමණක් නොව ඒ ලෙසම ජීවත් වීමට මා හට උපකාර කරන්න.

ස්වාමීන්වහන්සේ ඔබට උන්වහන්සේට දුරින් නොව උන්වහන්සේ ට ළඟින් ගමන් කිරීමට උන්වහන්සේගේ කරුණාව දෙන සේක.

************

## කැඳවීමේ ප්‍රතිරාවය

සැම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

වාර්ෂික දායකත්වය - රු. 100/-    ජීවිත දායකත්වය - රු. 2000/-

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඥා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
**on 3rd JULY 2023.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**